
# මලීතිගේ පළමු පාසල් දවස



කිත්නුලි සවිත්මා රාජපක්ෂ

# මලිතිගේ පළමු පාසල් දවස

## කිත්නුලි සවිත්මා රාජපක්ෂ

**පළමු මුද්රණය - 2023**

**ISBN : 978-624-208-120-5**

**කතෘගේ වෙනත් කෘති**

1. සිගිතිට පාඩමක්
2. අපුරු සැලසුම
3. මගේ මල්ලියා
4. kithnuli Learns to Keep a promise

# පිදුම

**මේ දක්වා**

**අකුරු කරපු**

**සියලුම ගුරු මවුපියන්ට**

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර


විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

එයා පළවෙනියට ඉස්කෝලේ යන්නේ අද. ගෙදර කලබල ගොඩයි. අම්මා කිරිබත් උයනවා. අත්තම්මලා පිරිත් කියන්න ලෑස්ති වෙලා. එත් මලිති හිටියේ වෙන ලෝකයක. එයා හිතුවා එයාට තනියම යාලුවෙක් නැතුව ඉන්න වෙයි කියලා. ඉතින් එයා ඉස්කෝලේ නොයා ඉන්නවා කියලා හිතුවා.





**එත් එයාගේ අම්මයි තාත්තායී එකට ඉඩ දුන්නේ නැහැ. මලිතිට පුදුම බයක් දැනුණේ.එයා ඉස්කෝලෙට යනකන්ම අම්ම්මාගේ අතේ එල්ලිලා අඩ අඩ ගියේ.**

ඉස්කෝලෙට ආවම පුදුම ජාති, ලොකු ලොකු ගොඩනැගිලි, අයියලා අක්කලලා ,ඒ මදිවට සද්ද ගොඩයි. මලිතිගේ බය තව වැඩි වුණා. එයාට තව හයියෙන් ඇඬුම් අවා. හැබැයි එයා වගේම පුංචි යාළුවෝ ගොඩක් පෝලිමේ හිටියා ලොකු ටීචර් හම්බ වෙන්න.පෝලිම ටිකෙන් ටික ඉස්සරහට යන්න පටන් ගත්තා. මලිතිගේ වාරය ආවා. ලොකු මැඩම් ආදරයෙන් මලිති ගේ ඔළුව අත ගෑවා.පුංචි විහිළුවක් කලා. ටීචර් එයාගේ නම, එයා ඉන්න තැන වගේ දේවල් ඇහුවා. ඒතකොට මලිතිගේ ඇඬුම ඉබේම නැවතුනා.හීන් හිනාවක් මුහුණට වැටුනා. පුංචි පුංචි ප්රශ්න කිහිපයක් ඇහුවා.මලිති හොදින් ඒවාට උත්තර දුන්නා.දැන්නම් එයාගේ බය කොහෙන් ගියද දන්නේ නැහැ." ඔයා හරිම දක්ෂ දරුවෙක් . කවද හරි අපේ ඉස්කෝලෙට කීර්තියක් ගේනවා . කිසි සැකයක් නැහැ." ලොකු මැඩම් කීවා.



ඒ කාරණාවලට මලිනි ගොඩක් සන්තෝස වුණා. දැන් පෝලිමත් ඉවර වුණා. බබාලාව පන්තියේ තියල යන්න කියලා මැඩම් අම්මලා ට කීවා.මලිනිට චුට්ටක් වත් බය හිතුනේ නැහැ. දෙමව්පියෝ ඔක්කො ම ගියා. ඔන්න සමහර අය තාම අඩනවා. ඒත් මලිනි නම් සැහැල්ලුවෙන් හිටියා.

ඉස්කෝලේ හරිම ෂෝක්.පන්ති කාමරය හරිම ලස්සනයි පිළිවෙලයි. පන්ති භාර මැඩම්මුත් හරි කරුණාවයි.

එයාට එහා පැත්තේ හිටියේ සිලුනි කියලා බබෙක්. එයා වෙව්ල වෙව්ල මලිනිගේ නම ඇහුවා.මලිනි එයාගේ නම කිව්වා. සිලුනි එයාගේ නම කිව්වා. ටික වෙලාවක් යන කොට ඒ දෙන්නා යාළු වුණා. දැන් ඒ දෙන්නා හොද යාළු වෝ.

කාලය වේගයෙන් ගත වුණා .මලිනි පාසල් වැඩ හොදින් ඉටු කලා. බාහිර වැඩත් උනන්දුවෙන් කළා. පාසලේ හැමෝ ම එයා ට ආදරේ වුණා.එයාලා එකට පාඩම්කරලා හැම විභාගයකට ම හොදින් මුහුණ දුන්නා. 5 වසර ශිෂත්වය ද ඉහළින් ම සමත් වුණා.

නිමි





## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වු මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය ඔස්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01